# වේවැල් කර්මාන්තයේ නව ප්‍රවණතා පිළිබඳ භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

එච්.ඒ.එස්.ආර්. හෙට්ටිආරච්චි[1]

යූ.ඒ චන්ද්‍රසේන [2]

## සංක්ෂේපය

කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අංශය සමස්ථ ආර්ථිකයේම ඉදිරිපස හා පසුපස බැඳීම ශක්තිමත් කරමින් අළුතින් පිබිදෙන ආර්ථිකයට ගැම්මක් හෝ පිම්මක් නැගීමට අවශ්‍යය ජවයද සම්පාදනය කිරීමේ සුවිශේෂ හැකියාවක් අත්කරගෙන සිටී. විශේෂයෙන්ම වර්තමාන වේවැල් කර්මාන්තය තුළ අඩු ආයෝජනයකින් වැඩි රැකියා ප්‍රමාණයක් නිර්මාණය කිරීමේ හැකියාවත්, දේශීය අමුද්‍රව්‍යය සඳහා විශාල ඉල්ලුමක් ඇති කිරීමත්, දේශීය පරිභෝජන අවශ්‍යතා ඉටුකිරීමට ඇති විභවතාවන්, මහා පරිමාණ නිෂ්පාදනය සඳහා අන්තර් භාණ්ඩ නිපදවීමට ඇති හැකියාවත් සැලකිල්ලට ගත් විට මෙම අංශය සතු නිදන් ගත විභවතාව හඳුනා ගැනීමට අපහසු නොවේ. කුඩා හා ග්‍රාමීය කර්මාන්තයක් වන වේවැල් කර්මාන්තය පවතින සමාජ ආර්ථික යතාර්ථය තුළ සිය අභ්‍යන්තර ශක්තීන් හකුළුවා ගනිමින් භූගෝලීය වශයෙන් ඇතැම් විට හුදකලා වෙමින් ආර්ථික අවස්ථාන් ප්‍රයෝජනය ගැනීමේ නොහැකියාව ප්‍රදර්ශනය කරයි. මෙලෙස වර්තමාන ලංකාවේ වේවැල් කර්මාන්තය සඳහා රදාවඩුන්න ග්‍රාමය ප්‍රචලිත වී ඇති අතර අනාදිමත් කාලයක සිට කර්මාන්තයේ තිරසර බව, දිගු කාලීන රදාපැවැත්ම හා ඒ සඳහා බලපානු ලැබූ තාක්ෂණය, අලවිය හා නිෂ්පාදනයන්හි බලපෑම කෙසේද යන්න සොයා බැලීම අධ්‍යයනයේ අරමුණ විය.

මෙම අධ්‍යයනය සිදුකිරීම සඳහා බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 360/සී රදාවඩුන්න මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තෝරා ගනු ලැබීය. පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත දෙයාකාරයම පදනම් කර ගත් අතර අධ්‍යයන නියැදිය ලෙස වේවැල් නිෂ්පාදනය කරන පවුල් අතරින් පවුල් 30ක් අහඹු නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. මෙහිදී නියැදි දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය පදනම් කර ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක ක්‍රමය මෙන්ම විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරන ලදී.

මෙම අධ්‍යනයේ ප්‍රතිඵල ලෙස දැක ගත හැකිවූයේ රදාවඩුන්න ග්‍රාමය තුළ කර්මාන්තය අනාදිමත්ව පැවතීමට හේතුවයි. වර්තමාන කර්මාන්තයට යොදා ගන්නා තාක්ෂණය, නව ආදේශන වෙළඳපළ ආක්‍රමණය කිරීම, අලවිකරණ ක්‍රියාවලියේ හුදුනාගත විවිධතා හා වෙළඳපළ තත්වය මෙන්ම අධ්‍යයන ප්‍රදේශවාසීන් සතුව පවතින රැකියා විරහිත බවට ඇති එකම විසඳුම වේවැල් කර්මාන්තයේ නියැලීම යන විවිධ හේතු හා විවිධ ප්‍රවණතා නිසා වර්තමානයේද මෙම කර්මාන්තය අධ්‍යන ප්‍රදේශයේ නොනැසී පවතී. අනාදිමත්කාලයක සිට නොනැසී පවතින මෙම කුඩා කර්මාන්තය නව ප්‍රවණතා හමුවේ සංවර්ධනය කිරීම හා ජාත්‍යන්තර වෙළඳපළ තත්වයක් නිර්මාණය කිරීමට තරම් විභවතාවක් පවතින නිසා මෙය නගා සිටුවීමට රාජ්‍යය අනුග්‍රහය නොමඳව ලැබිය යුතුය.

ප්‍රමුඛ පදඃ වේවැල්, ප්‍රවනතා, කර්මාන්තය, භාණ්ඩ, නිෂ්පාදනය

*1. භූගෝල විද්‍යාව, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. මහාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*